සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All rights reserved ]

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ශ්‍රී ජයවර්
Sri Jayawardhanapura Education Zone Sri Jayawardhanapura Education Zone Sri Jayawardhanapura Education Zone Sri Jayawadhanapura
ஸ்ரீ ஜெயவர்த்தனபுரா கல்வி மண்டலம் ஸ்ரீ ஜெயவர்த்தனபுரா கல்வி மண்டலம் ஸ்ரீ ஜெய

## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## ஸ்ரீ ஜெயவர்த்தனபுரா கல்வி மண்டலம்
## Sri Jayawardhanapura Education Zone

### අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020
### கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை - 2020
### General Certificate of Education (Adv. Level) Examination - 2020

| | | | |
|---|---|---|---|
| පෙරදිග සංගීතය I<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | 13 ශ්‍රේණිය<br>தரம் 13<br>Grade 13 | 54 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

අවසාන වාර පරීක්ෂණය - 2020

විභාග අංකය: ........................................

**උපදෙස්:**
* ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ පිළිතුරු සපයන්න.

- අංක **01** සිට **30** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාල අංක ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**1.** "නාදයෙන් තොර ගීතයත්, නාදයෙන් තොර ස්වරයත්, නාදයෙන් තොර නැටුමකුත් නොමැති වන අතර ඒ සියල්ල නාදය ආත්ම කොට ගෙන ඇත." සංගීතය පිළිබඳව ඉහත අදහස ඇතුලත් ග්‍රන්ථය වනුයේ,
(1) නාට්‍ය ශාස්ත්‍රය (2) සංගීත පරිජාත (3) සංගීත රත්නාකරය
(4) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය (5) බෘහත්දේශී (........)

**2.** කර්ණාටක සංගීත පද්ධතියට ආවේනික රාගයකි.
(1) භෛරව (2) කාලිංගඩා (3) ජයජයවන්ති (4) හංසධ්වනි (5) ආසාවරී (........)

**3.** පිළිවෙළින් කාෆි හා ඛමාජ් මේලගත රාග යුගලයකි.
(1) දේස් -භාගේශ්‍රී (2) ජයජයවන්ති - භාගේශ්‍රී (3) භාගේශ්‍රී - තිලක්කාමෝද්
(4) දේස් - ජයජයවන්ති (5) භාගේශ්‍රී - හංසධ්වනි (........)

**4.** අලාප, තනාලංකාර, තබ්ලා බෝල් ආදි අංග සියල්ලම අන්තර්ගත රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීයකි.
(1) මම දෙව්දූනි දෙවොලට (2) වස්දඬු රාවේ (3) මුව මුක්තාලතා
(4) හංසරාජිනී (5) මාරම්බරී (........)

**5.** භෛරව රාගයට ආදාළ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) සවස සන්ධි ප්‍රකාශ රාගයකි.
(2) පූර්වාංගවාදි රාගයකි.
(3) කෝමල ගාන්ධාරය විවාදි ස්වරයක් ලෙස යෙදේ.
(4) රිෂභය හා ධෛවතය අන්දෝලනය කෙරේ.
(5) අරෝහණයේදි ගාන්ධාරය වර්ජ වේ. (........)

[දෙවැනි පිටුව බලන්න.

**6.** භාගේශ්‍රී රාගයට අයත් ස්වර ඛණ්ඩ දෙකක් පහත කොටුවල දැක්වේ.

| 1 | 2 |
|---|---|
| මමම ගුමම ගරිස | ස- ම- ගු- ම- |

මෙම ස්වර ඛණ්ඩ ගායනයේදී වඩාත් ගැළපෙන්නේ කෙසේ ගායන කිරීමද?

(1) පළමු කොටුවේ ස්වර ඛණ්ඩ මීන්ඩ් කරමින් හා දෙවැනි කොටුවේ ස්වර ඛණ්ඩ ගමක් කරමින්.
(2) පළමු කොටුවේ ස්වර ඛණ්ඩ ගමක් කරමින් හා දෙවැනි කොටුවේ ස්වර ඛණ්ඩ මීන්ඩ් කරමින්.
(3) පළමු කොටුවේ ස්වර ඛණ්ඩ මූර්කි කරමින් හා දෙවැනි කොටුවේ ස්වර ඛණ්ඩ මීන්ඩ් කරමින්.
(4) පළමු කොටුවේ ස්වර ඛණ්ඩ මීන්ඩ් කරමින් හා දෙවැනි කොටුවේ ස්වර ඛණ්ඩ මූර්කි කරමින්.
(5) පළමු කොටුවේ ස්වර ඛණ්ඩ ධ්‍රැත ලයෙන් හා දෙවැනි කොටුවේ ස්වර ඛණ්ඩ විලම්භ ලයෙන් ගැයීමෙන්. (........)

**7.** කර්ණාටක සංගීත පද්ධතියට අනුව වයලීනය සුසර කරනුයේ,

| | 4 තත | 3 තත | 2තත | 1තත |
|---|---|---|---|---|
| (1) | ප̣ | ස | ප | ස̇ |
| (2) | ප̣ | රි | ධ | ග̇ |
| (3) | ම | ස | ප | රි̇ |
| (4) | ප̣ | ස | ප | රි̇ |
| (5) | ස̣ | ප̣ | ස | ප |

(........)

**8.** රාත්‍රි දෙවන ප්‍රහාරයේදි ගැයෙන රාග යුගලයකි.
(1) දේස් - ජයජයවන්ති (2) ආසාවරී - ජෞනපුරි (3) තිලක්කාමෝද් - භාගේශ්‍රී
(4) භාගේශ්‍රී - දේස් (5) තිලක්කාමෝද් - ආසාවරී (........)

**9.** 'ශ්‍රී ධුමක චලිත රාම චන්ද්‍ර' ගීය කිනම් ගායන ශෛලියකට අයත් වේද?
(1) භජන් (2) ගසල් (3) ධ්‍රැම්රි (4) ටප්පා (5) ධමාර් (........)

**10.** තබ්ලාව වාද්‍ය භාණ්ඩය හා සම්බන්ධතාවයක් නොදක්වන වරණය වනුයේ,
(1) සව්වා, ලව, බද්ධි (2) ගත්, පරන්, රේලා (3) ගෙ , න, තිට
(4) ජලා, ලෙහෙරා, සූත් (5) තිහායි, චක්‍රධාර්, ෆල්ටා (........)

**11.** | ම ප | ධ නි | ස̇ - | රි̇ග̇ රි̇ස̇ | රි̇නිධප ප | මග රිස | මෙම ප්‍රස්තාර පාදය,

(1) ආසාවරී රාගයට අයත් මධ්‍යලය ගීයකි.
(2) ආසාවරී රාගයට අයත් විලම්භ ලය ගීයකි.
(3) ජෞනපුරි රාගයට අයත් මධ්‍යලය ගීයකි.
(4) ජෞනපුරි රාගයට අයත් විලම්භ ලය ගීයකි.
(5) භාගේශ්‍රී රාගයට අයත් විලම්භ ලය ගීයකි. (........)

**12.** | නි̣ස රිම පනි ස̇රි̇ | ස̇නි ධප මග රිස මෙම තානාලංකාරය,

(1) දේශ් රාගයට අයත් සපට් තානාලංකාරයකි.
(2) දේශ් රාගයට අයත් අලංකාරික තානාලංකාරයකි.
(3) තිලක්කාමෝද් රාගයට අයත් අලංකාරික තානාලංකාරයකි.
(4) තිලක්කාමෝද් රාගයට අයත් සපට් තානාලංකාරයකි.
(5) තිලක්කාමෝද් රාගයට අයත් මිශ්‍ර තානාලංකාරයකි. (........)

**13.** ' රි ම ප , නි ධ ප ' මෙම ස්වර සංගතියේ,
(1) ධෛවතය කෝමල කළ විට ආසාවරි රාගයට අයත් වේ.
(2) ධෛවතය කෝමල කළ විට ජෞනපුරි රාගයට අයත් වේ.
(3) නිශාදය කෝමල කළ විට දේශ් රාගයට අයත් වේ.
(4) නිශාදය කෝමල කළ විට ආසාවරි රාගයට අයත් වේ.
(5) නිශාදය කෝමල කළ විට ජෞනපුරි රාගයට අයත් වේ. (........)

**14.** පිළිවෙළින් මාල්කෞන්ස්, භාගේශ්‍රී, පීළු රාග ඇසුරින් නිර්මාණය වී ඇති සරල ගී තුන වනුයේ,
(1) හංසරාජිනී, මුව මුක්තා ලතා, හෝ පළු වනපෙත
(2) හෝ පළු වනපෙත, හංසරාජිනී, මුව මුක්තා ලතා
(3) හංසරාජිනී, හෝ පළු වනපෙත, මම දෙව්දූනි
(4) හංසරාජිනී, හෝ පළු වනපෙත, මුව මුක්තා ලතා
(5) හංසරාජිනී, මම දෙව්දූනි, මුව මුක්තා ලතා (........)

**15.** භෛරව හා කාලිංගඩා රාග යුගලය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
(1) භෛරව මේලයෙන් උපත ලබා ඇති රාග දෙකකි.
(2) සම්පූර්ණ රාග ජාතියට අයත් රාග දෙකකි.
(3) උදය සන්ධි ප්‍රකාශ රාග දෙකකි.
(4) වාදි, සංවාදි ස්වර සමාන වන රාග දෙකකි.
(5) උත්තරාංගවාදි රාග දෙකකි. (........)

**16.** එක් එක් පුද්ගලයන් එක් එක් කාර්යයයේ මහා දාර්ශනිකයන් වන්නේ ඒ ඒ කාර්යය හා බැඳි බුද්ධිය අනෙක් අයට වඩා වැඩි නිසාය. බහුවිධ බුද්ධි න්‍යායට අනුව කායික සංචලනමය බුද්ධිය සඳහා හොඳම නිදසුන වන්නේ පහත දැක්වෙන අය අතුරින් කවුරුන්ද ?
(1) මහාචාර්ය ගුණපාල (2) පණ්ඩිත් අමරදේව (3) චිත්‍රසේන - වජිරා
(4) සෝලියස් මෙන්ඩිස් (5) සෙනරත් පරණවිතාන (........)

**17**. බවුජි බවුරා චිත්‍රපටියේ "ආජ ගවන මොනො" හා සර්ගම් චිත්‍රපටියේ එන සරිගම ගීතය ගයන ලද සම්භාව්‍ය සංගීත ශිල්පියා වනුයේ,
(1) පණ්ඩිත් බිම්සෙන් ජෝෂි (2) උස්තාද් අමීර් ඛාන් (3) බෙගම් පර්වින් සුල්තානා
(4) පණ්ඩිත් ජස්රාජ් (5) උස්තාද් රෂීද් ඛාන් (........)

**18.** නාඩගම් සංගීතයේ පොතේ ගුරු විසින් ගයන අපතාලාත්මක ගීත විශේෂය වනුයේ,
(1) පොතේ ඉන්නිසිය (2) උරුට්ටුව (3) තෝඩායම
(4) තංගපාට (5) අංගහාරන් (........)

**19.** සැවුලා වන්නමට අයත් තාල රූපය වනුයේ,
(1) සුළු තනි තිත (2) සුළු මැදුම් දෙතිත (3) මැදුම් මහ දෙතිත
(4) සුළු මහ දෙතිත (5) තුන් සුළු දෙමග පස් තිත (........)

**20.** අප්‍රිකානු සංගීතය තුළ පැවති තාල රටාවක් **නොවන්නේ** මින් කුමක්ද?
(1) Reggae (2) Salsa (3) Waltz (4) Ramba (5) Samba (........)


**21.** මහනුවර යුගයේදී රචිත ග්‍රන්ථයකි,
(1) පැරකුම්බා සිරිත (2) සිරිත් මල්දම (3) පත්තිනි හැල්ල කවි පොත
(4) ගීත ගෝවින්දය (5) ගුත්තිලය (........)

**22.** තිව්‍ර මධ්‍යමයේ (ම') ස්වරයේ සංඛ්‍යාතය විය හැක්කේ මින් කුමක්ද?
(1) 303 (2) 320 (3) 340 (4) 360 (5) 384 (........)

**23.** නාඩගම් ගී සඳහා අදාළ **නොවන** ප්‍රකාශය වනුයේ,
(1) ස්ථායි, අන්තරා ආකෘතිය දක්නට ලැබීම.
(2) දක්ෂිණ භාරතීය මේල ඇසුරින් නිර්මාණය වී තිබීම .
(3) කතෝලික පසන් කන්තාරු තනුවල අභාෂය ලැබී තිබීම.
(4) තිර්ලානා, පසන්, චාපු, වඩිමුඩි ආදි තාල භාවිතා කිරීම.
(5) තෙරිකුත්තු වීදි නාට්‍ය වල ගී තනු වල අභාෂය ලැබී තිබීම. (........)

**24.** ගුලාම් අලි, පංකාජ් උදාස් යන නාමයන් හා බැඳි ප්‍රකට ගායන ශෛලිය වනුයේ,
(1) භජන් (2) ගසල් (3) තරාණා (4) ඨුම්රි (5) ධ්‍රැපද් (........)

**25.** දේශීය සම්ප්‍රදායික භාණ්ඩයක් වන හොරණෑවේ හඬට සමානතාවයක් දක්වන බටහිර සංගීතයේ වුඩ් වින්ඩ් ඩබල් රීඩ් (Wood wind double reed) වර්ගයට අයත් වන භාණ්ඩයකි.
(1) ට්‍රම්පට් (Trumpet) (2) ත්‍රම්බෝන් (Trombone) (3) ක්ලැරිනට් (Clarinet)
(4) ඕබෝ (Oboe) (5) සැක්සෆෝන් (Saxophone) (........)

**26.**



ඉහත බටහිර ප්‍රස්තාරයට අදාළ ටයිම් සිග්නේචරය වනුයේ,
(1) $\frac{3}{4}$ (2) $\frac{6}{8}$ (3) $\frac{4}{4}$ (4) $\frac{7}{4}$ (5) $\frac{5}{4}$ (........)

**27.**


ඉහතින් දැක්වෙනුයේ වාදනයේදී බෝව හසුරුවන ආකාරය අනුව භාවිතා වන සංකේතයකි. මෙම සංකේතය යොදා ඇති තැන දැක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය ඉතා කෙටි හඬකින් යුක්තව වාදනය කෙරේ. එය හඳුන්වනුයේ,
(1) ස්ටෙකාටෝ (Staccato) (2) පිසිකාටෝ (Pizzicato) (3) ලෙගාටෝ (Legato)
(4) ස්ලර් (Slur) (5) පියානිසිමෝ (Pianissimo) (........)

**28.** බටහිර සංගීතයට අයත් Quintet වාදනයක සංයුතිය වනුයේ,
(1) පියානෝ , වයලීන් (2) වයලීන් - 2 , වියෝලා , චෙලෝ
(3) වයලීන් , වියෝලා , චෙලෝ (4) පියානෝ , වයලීන් , වියෝලා , චෙලෝ
(5) පියානෝ , වයලීන් - 2 , වියෝලා , චෙලෝ (........)

**29.** පහත ස්වර පුවරු රූපසටහනේ ලකුණු කර ඇති ස්වර හතර එකවර වැයෙන විට නිකුත් වන කෝඩ් (chord) එක වනුයේ,



(1) G Major (2) G $Major^{7th}$ (3) $G^{7th}$ (4) $C^{7th}$ (5) C $Major^{7th}$ (........)

**30.** ඉහත ස්වර පුවරු රූපසටහනේ ලකුණු කර ඇති ස්වර වලින් ‘ස’ ස්වරය අත්හල විට නිකුත් වන කෝඩ් (chord) එක වනුයේ,
(1) B Major (2) B Minor (3) G Major (4) E Minor (5) E Major (........)

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** | ම ධ | ස̇ නි ධ | ම ප | ගු රි ස | මෙම ස්වර ඛණ්ඩය අයත් රාගයේ පංචමය ………….. ස්වරය ලෙස හඳුන්වනු ලැබේ.

**32.** කිසියම් තාලයක යේකාව හෝ තාල පදයෙහි රචනාවෙහි (අවනද්ධාක්ෂර රටාවෙහි) වෙනස් වීම, එම තාලයෙහි ……………………… ලක්ෂණය තීරණය කරයි.

**33.** ……………………………………….……………… යන ස්වර $B^b$ Major කෝඩ් එකට අයත් ස්වර වේ.

**34.** | 1 2 | 1 2 | 1 2 3 | ලෙස මාත්‍රා කැටිවන දේශීය සංගීතයේ තිත ………………….. වන අතර හින්දුස්ථානි සංගීතයේ එන ……………………  තාලයේ මාත්‍රා කැටිවීම හා සමානය.

**35.** ………………….. සහ …………………….. යන ගීතයන් වැදි ගී ඇසුරින් නිර්මාණය වූ නූතන සරල ගී වේ.

**36.** සංගීත විෂය හා සම්බන්ධ අධ්‍යාපනික ග්‍රන්ථයක් වන භාවික ගීත ග්‍රන්ථයේ රචකයා ……………………..……. වේ.

**37.** රජයේ සංගීත විද්‍යාලයේ මුල්ම විදුහල්පතිවරයා වූයේ ................................................ ඔහු ....................... සංගීත භාණ්ඩය වැයීමේ අතිදක්ෂයකි.

**38.** සුනිල් එදිරිසිංහයන් ගයන  ලෙංචිනා මගේ නංගියේ ගීතය …………. රංග ශෛලිය ඇසුරින් හා සනත්  නන්දසිරි සූරින් ගයන සිනහ නගන්නී ගීතය ................................ රංග ශෛලිය ඇසුරින් නිර්මාණය වූ සරල ගීතයන්ය.

**39.** ………………… සහ ……………………… මහනුවර යුගයේ රාජ සභාවට අයත් සංගීත ආයතන දෙකකි.

**40.** උත්තර භාරතීය බිලාවල් මේලයට සමාන දක්ෂිණ භාරතීය මේලය වනුයේ ………………….. මේලයයි.

- අංක **41** සිට **43** තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

ඉදුවරි සංගීත ප්‍රසංගයකදී රිදී ආලේපිත තහඩුවක් මත පර්දා නොමැතිව ස්වර උපදවා ගන්නා භාණ්ඩයකින් අ.පො.ස (උසස් පෙළ) සඳහා නිර්දේශිත රාගයකින් වාදනයක් ඉදිරිපත් කරන ලදී.  වාදිතයේ අන්තරා කොටස, | ම පප | ප ධ | ස̇ - | නි ධ | ම පප | ගුගු රිරි | ලෙස වූ අතර වාදිතය අවසානයේ තිහායි සහිත ස්වර කොටසක් තෙවරක් වයා වාදනය අවසන් කරන ලදි.

**41.** ඉදුවරි වාදනය කරන ලද්දේ …………………………… නම් සංගීත භාණ්ඩයයි.

**42.** ඉදුවරි වාදනය කළ රාගයට අදාළ මේලයේ මේල, ස්වර පිළිවෙළින් ……………………………………… වේ.

**43.** ඉහත වාදිතයට අදාළ තාලය ………….. වන අතර වාදනය අවසානයේ වැයූ ශිල්පාංග කොටස ...…………… නමින් හැඳින්වේ.

**44.** ලෝනා මුණිරජාගේ ගීතය ……………………… රාගය, ඇසුරින් නිර්මාණය වී ඇති අතර, පායන මේ බැද්දේ ගීතය …………………… ශෛලිය ඇසුරින් නිර්මාණය වී ඇති නූර්ති ගීතයන් ය.

**45.** චිත්‍රපටි ගී අතුරින්, ගිටාරයෙන් ප්‍රධාන කෝඩ් එක නිරතුරුව වැයෙන ස්වර පරාසය අඩු ගීයක් ලෙස ……………. ගීතය නම් කළ හැකි අතර සංගීත භාණ්ඩ රාශියක් භාවිතා කොට සංධ්වනියක් මෙන් දිස්වන ගීතයක් ලෙස …………………… ගීතය නම් කළ හැකිය.

**46.** ……………..…… හා ……………………. යන ස්කේල්ස් (Scales) වල කිසිඳු ෆැල්ට් (Flat) ස්වරයක් හෝ ෂාප් (Sharp) ස්වරයක් යෙදෙන්නේ නැත.

**47.** ……………………………… ගීතය ආඝාතාත්මක වැලපුම් ගීයක් වන අතර ……………………………… ගීතය අනාඝාතාත්මක වැලපුම් ගීයක් වේ. .

**48.** ඉස්ලාමීය සංගීතයේ සියලුම අංග අන්තර්ගත ඉපැරණි ජන ගීය …………………………… ලෙස හඳුන්වන අතර චීන සංගීතයේ ස්වර හඳුන්වනුයේ ………………… නමිනි.

**49.** ගද්‍ය හා පද්‍ය යන කොටස් දෙකම ඇතුළත් ගැමි ගායනාවක් ලෙස …………………………… දැක්විය හැකි අතර කාන්තාවන්ට සුවිශේෂී වූ අඩු ලයකින් හා සංයමයෙන් යුත් ගැමි ගී විශේෂය ………………………… වේ.

**50.** ප්‍රේමසිරි කේමදාසයන් නිර්මාණය කරන ලද ………………… නාට්‍යයත්, ජන ගී ආශ්‍රයෙන් ඩබ්. බී. මකුලොලුව මහතා නිර්මාණය කළ ………………… නාට්‍යයත් ඔපෙරා රංග ශෛලිය අනුව බිහි වී ඇත

***